# කලාභූෂණ රාජ්‍ය සම්මානලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලාංකේය ජ්‍යෙෂ්ඨ කලාකරුවන් ඇගයීමට ලක් කරමින් ඔවුනට රාජ්‍ය සම්මානයෙන් උපහාර දැක්වීම උදෙසා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, හින්දු ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා මුස්ලිම් ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව වාර්ෂිකව සංවිධානය කරනු ලබන කලාභූෂණ රාජ්‍ය සම්මාන උළෙල 2019 දෙසැම්බර් මස 15 වන දින පැවැත්වීමට නියමිතව ඇත. කලාභූෂණ සම්මානලාභීන් තෝරාගැනීමේ කාර්යාවලිය පහත පරිදි වේ.

I. කලාභූෂණ අයදුම්පත් පෞද්ගලිකව කැඳවීම් සිදු කරනු නොලැබේ.

II. සම්මානලාභීන් තේරීම සිදු කරනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් කරනු ලබන කමිටුවක් විසිනි. මෙම කමිටුව සඳහා කලාකරුවන්ද ඇතුලත්වේ.

III. ඉහත කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කලාකරුවන්ගේ තොරතුරු එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංස්කෘතික නිලධාරීන් කලාකරුවන් වෙත ගොස් රැස්කර ගත යුතුය.

IV. සුදුසුම කලාකරුවා තෝරා ගැනීමේදී පහත සඳහන් නිර්නායකයන් සලකා බලනු ලැබේ.

- වයස් කාණ්ඩය : ( අවුරුදු 60 ඉක්මවා සිටිය යුතුය)
- ක්ෂේත්‍රයේ කලාකරුවකු ලෙස කටයුතු කල කාලය
- නිර්මාණ සිදු කරන ලද කලා ක්ෂේත්‍රය
- පරම්පරාගත ශිල්පියෙකු වීම
- කලායතනාධිපතිවරයකු වීම
- ලබා ඇති ජයග්‍රහන : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය
  ( ඉදිරිපත් කරන ලද ජයග්‍රහන සියල්ල කලා ක්ෂේත්‍රයට අදලා ඒවාද යන්න සෑහිමකට පත් විය යුතුය)
- ලබාගත් ඇගයීම් හෝ ගරු සම්මාන
  ( ලබා ඇති ඇගයීම් හෝ සම්මාන සියල්ල කලා ක්ෂේත්‍රයට අදාල ඒවාද යන්න සෑහීමකට පත් විය යුතුය)
- සිදු කළ හෝ ජනගත කළ නිර්මාණකරණයන් සංඛ්‍යාව
- සංස්කෘතික බලමණ්ඩල සාමාජිකත්වය
- සමාජ සේවා කටයුතු

V. කිසියම් කලාකරුවෙක් සිදුකරන ජාතික මෙහෙවර දැඩි ලෙස අධ්‍යයනය කිරීමෙන් පසුව සම්මානය හිමිවිය යුතු “කලාකරුවා” තීරණය කල යුතු අතර, කලාකරුවන් පහත පරිදි අර්ථ ගන්වා ඇත.

- නාට්‍යකරුවන් හා රංගන ශිල්පීන්, ලේඛකයන්, චිත්‍ර හා මූර්ති ශිල්පීන්, කැටයම් ශිල්පීන්, ලාක්ෂාවියමන්, රූකඩ, නර්තන ශිල්පීන්, බෙරවාදකයෝ, සංගීතඥයින්, කවියන්, ගායක ගායිකාවන්, චිත්‍රපට හා ටෙලිනාට්‍යකරුවන්, බයිලා වාදකයින්, අංගම්පොර ශිල්පීන්, මැජික් හා වෙනත් ජන කලා ශිල්පීන් මෙම රාජ්‍ය සම්මාන සඳහා සුදුසුකම් ලබයි. තවද වෘත්තිමය වශයෙන් හෝ පාරම්පරික වශයෙන් එම ක්ෂේත්‍රයේ නියුතු කලාකරුවන් ගැන විශේෂයෙන් සලකා බලා සහතික ඉදිරිපත් කල නොහැකි එහෙත් පසුගිය වසර 10 ක කාලයක් හෝ ඊට පෙර කලාවට විශිෂ්ඨ සේවයක් ඉටුකල කලාකරුවන් සම්බන්ධව සොයා බලා ඔවුන් ඉදිරිපත් කරන තොරතුරු පිළිගත හැකි මට්ටමක පවතින්නේ නම් තෝරා ගත හැකි වේ.